සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- පළමුවන කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසින් 01, 02, 03 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 07 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන

(1) 18 කි. (2) 32 කි. (3) 60 කි. (4) 54 කි.

02 මහාප්‍රාණ අක්ෂර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) ශ, හ, ඵ, ද (2) ඹ, ළ, බ, ඨ (3) ඳ, ජ, ඬ, ඹ (4) ඛ, ඝ, ඵ, ඨ

03 ප්‍රථම පුරුෂ අතීතකාල ස්ත්‍රී ලිංග ක්‍රියා පදය තෝරන්න.

(1) කන්නීය (2) කයි (3) කෑවේය (4) කෑවාය

04 උක්ත රූප ගන්නා නාම පදය කුමක් ද?

(1) මහල්ලෙක් (2) මං (3) ළමයෙකු (4) අප

05 හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂරය වෙන්නේ

(1) ඤ (2) ඹ (3) ද (4) ම, ය

06 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය වන්නේ

(1) සංඛ්‍යාව (2) අවබෝදය (3) වර්ගඵලය (4) ප්‍රතිපත්තිය

07 ගැටපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල පිළිවෙළින් යෙදුණු වචනය

(1) ගෘහය (2) කෘමියා (3) වෘත්තය (4) වෘත්තිය

- **අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවල යටින් ඉරක් අඳින ලද පදයට වඩාත් සමාන අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

08 හමන මඳනුල සුවදායක ය.

(1) බටය (2) වලාකුළ (3) කුරුල්ලා (4) සුළඟ

09 සමනලයා කුසුම මත වසා සිටියි.

(1) මල (2) පියුම (3) සියපත (4) ගස

10 තුරිඳු වනපෙත එළිය කරයි.

(1) සූර්යයා (2) දිවාකර (3) තාරපති (4) දිනිඳු

- **අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල විරුද්ධාර්ථ පදය තිත් ඉරමත ලියන්න.**

11 අනාදරය ........................................................

12 දුප්පත් ........................................................

13 බොරු ........................................................

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල විශේෂණ පද තෝරන්න.**

14 නපුරු මිනිසා ළමයාට දඬුවම් කළේ ය.

(1) දඬුවම් (2) නපුරු (3) මිනිසා (4) ළමයා

15 නංගී මිහිරි ගීයක් ගයමින් නැටුවා ය.

(1) මිහිරි (2) නංගී (3) ගීයක් (4) ගයමින්

16 අශ්වයා වටයක් ගමන් කර වේගයෙන් දිවුවේ ය.

(1) අශ්වයා (2) වටයක් (3) ගමන් (4) වේගයෙන්

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවලට සුදුසු ආඛ්‍යාත පද වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

17 ගස් පෙළ පරිසරය අලංකාර ................................................ කරති. / කරයි.

18 වෙළෙන්දිය බඩු .................................................................. විකුණුවේ ය. / විකුණුවා ය.

19 නුඹ උදෑසන අවදි ................................................................. වෙහි / වෙහු

20 පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉරිමත ලියන්න.

හැමෝම්මරවනාලිව්වදලියලාතියෙනරවනාකියවලාඒවයේඅඩුපාඩුදැනගන්නඔයදරුවෝකැමතියිනේද

........................................................................................................................................................

........................................................................................................................................................

........................................................................................................................................................

(ලකුණු 2 x 20 = 40)

**6 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **01, 02, 03 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) මා දුටු සීගිරිය

(ii) මාර්ග අනතුරු වළක්වා ගනිමු.

(iii) ගස්වැල් සුරකිමු.

(iv) අලුත් අවුරුදු උත්සවය

(v) මා ගිය ගුවන් ගමන (ලකුණු 20)

02 පහත අවස්ථා අතරින් එකකට පිළිතුරු සපයන්න.

(අ) අසනීප වී සුවය ලබමින් සිටින තම මිත්තණියගේ සුවදුක් විමසා නුදුරු දිනෙක ඇය බැලීමට පැමිණෙන බව ද දක්වමින් ඇයට යවන ලිපිය ලියන්න.

<u>නැතහොත්</u>

(ආ) තම මිත්තණියට නිරෝගි සුවය පතා යවන සුබ පැතුම් පත සකස් කරන්න. (ලකුණු 10)

03 පහත දැක්වෙන කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කල් ඇතිව ම නැගිටි මි
මල් වත්තේ ඇවිදි මි
ඇල් සුළඟේ රස බො මි
කම්මැලිකම දුරල මි

ගුරු දෙවි දැක නැගිටිමි
නැගිට දෙපා වඳිනෙමි
වැඳ පොත් පාඩම් දෙමි
දීලා සත් උගනිමි

(i) කවිවලින් කියැවෙන ළමයා ඇවිදින්නේ කොහේද?

(ii) ඇල් සුළඟ යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iii) කවියෙන් කියැවෙන, ළමයින් දුරලන්නට අදහස් කළ යුත්තේ කුමක් ද?

(iv) පන්ති කාමරයේ දී ගුරුවරුන් කියාදෙන, යහපත් ක්‍රියාකාරකම් තුනක් මෙම කවි පන්තියෙන් සොයා ලියන්න.

(v) 'සත් උගනිමි' යන්නෙහි අදහස ලියන්න. (ලකුණු 2 x 5 = 10)

04 සුදුසු අක්ෂරය යොදා හිස්තැන් පුරවන්න.

(i) පරීක්ෂ .......... ය
(ii) වෙළෙඳපො ..........
(iii) මර .......... ය
(iv) ප්‍රශ් .......... ය
(v) මහ .......... මිනිසා
(vi) සිල් මෑ .......... යෝ
(vii) ව .......... ලු
(viii) දර් .......... නය
(ix) .......... දරුවා
(x) ත .......... කොළ (ලකුණු 1 x 10 = 10)

05 පහත දැක්වෙන අනතීත කාල වාක්‍ය අතීතකාලයට හරවා ලියන්න.

(i) මම තෙල්මල් රැගෙන පන්සල් යමි.
(ii) තොපි ගමට යහු.
(iii) ශිෂ්‍යායාව අභ්‍යාස පොත ගුරුතුමියට දෙයි.
(iv) ගුරුතුමා පුස්තකාලය දෙසට ගමන් කරයි.
(v) කුරුල්ලෝ කෑම සොයා පියාඹති. (ලකුණු 1 x 10 = 10)

06 පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) මැකී ගිය දඩමං කෘතියේ පරිවර්තකයා කවුද?
(ii) උදයසිරි පද්‍ය පන්තිය රචනා කළේ කවුද?
(iii) අභය හේවාවසම් මහතා විසින් සිංහලයට පරිවර්තනය කරන ලද කෘතිය කුමක් ද?
(iv) පන්සිය පනස් ජාතක පොත ලියැවුණේ කිනම් රාජධානි සමයේ ද?
(v) කුමාරතුංග මුනිදාස මහතා විසින් රචිත ළමා ප්‍රබන්ධ කතා පොත් දෙකක් ලියන්න.

(ලකුණු 1 x 10 = 10)

07 පහත උධෘත උපුටාගත් පාඩම්වල නම් ලියන්න.

(i) ''හනික, හනික, බලා ඉන්ට කල් නෑ''
(ii) ''එදා නම් තොපට පින් දෙන්නට ද මට සිහි මඳ වියැ කමා කරවු.''
(iii) තමා බෝට්ටුවෙහි ගෙනා බඩු වෙරළෙහි තබා ගසක් යට හිඳ සිටියේ ය.
(iv) හුනට කන්න බැරි හුන්නස් ගිරි කන්ද
මෙකඳු තුනට නායක සමනල කන්ද
(v) බලං අපි උන්නේ
එහෙං එතකන්නෙ (ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 3 (02) 4 (03) 4 (04) 1 (05) 2 (06) 3 (07) 2 (08) 4
(09) 1 (10) 3 (11) ආදරය (12) පොහොසත් (13) ඇත්ත (14) 2
(15) 1 (16) 4 (17) කරයි. (18) විකුණුවා ය. (19) වෙහි.

(20) හැමෝ ම රචනා ලිව්වද? ලියලා තියෙන රචනා කියවලා ඒවායේ අඩුපාඩු දැනගන්න ඔය දරුවො කැමතියි නේද?

## II කොටස

01. මාතෘකානුකූලව කරුණු ගළපා ලියා ඇති ආකාරය අනුව ලකුණු පිරිනමන්න. පහත ලකුණු ආකෘතිය සැලකිල්ලට ගන්න.
    මාතෘකාවට අනුව කරුණු සඳහා ලකුණු 6 යි.
    සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව සඳහා ලකුණු 10 යි.
    ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3 යි. (මුළු ලකුණු 20 යි.)
    (ඉහත ආකාරයට සුදුසු ලකුණක් පිරිනමන්න.)

02. නිර්මාණාත්මකව නිවැරදි ව සකස් කර ඇති ආකාරය අනුව ලකුණු පිරිනමන්න.
    ආකෘතිය ලකුණු 3 යි.
    කරුණු ලකුණු 5 යි.
    ශිල්පීය දක්ෂතා ලකුණු 2 යි. (මුළු ලකුණු 10 යි.)
    (සුදුසු පරිදි ලකුණු ප්‍රදානය කරන්න.)

03 (i) මල් වත්තේ
(ii) සිසිල් සුළඟ
(iii) කම්මැලිකම
(iv) දෙපා වැදීමයි
(v) ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගනිමි. (ලකුණු 2 x 5 = 10)

04 (i) ණ (ii) ළ (iii) ණ (iv) න (v) ලු
(vi) ණි (vii) ළ (viii) ශ (ix) ළ (x) ණ
(ලකුණු 2 x 5 = 10)

05 (i) මම තෙල්මල් රැගෙන පන්සල් ගියෙමි.
(ii) තොපි ගමට ගියෙහු.
(iii) ශිෂ්‍යාව අභ්‍යාස පෙත ගුරුතුමියට දුන්නා ය.
(iv) ගුරුතුමා පුස්තකාලය දෙසට ගමන් කළේ ය.
(v) කුරුල්ලෝ කෑම සොයා පියැඹූහ. / පියැඹුවෝ ය. (ලකුණු 2 x 5 = 10)

06 (i) ඒ. පී. ගුණරත්න
(ii) එස්. මහින්ද හිමි
(iii) බ්‍රෝහියර් දුටු ලංකාව
(iv) කුරුණෑගල
(v) හත්පණ, හීන්සැරය, මඟුල්කෑම (ලකුණු 2 x 5 = 10)

07 (i) විචෙං චුලංගෙං යමු කිරි නෑනෝ
(ii) අලි උවදුර
(iii) ක්‍රියා පද හා එහි ප්‍රභේද
(iv) සසඳ සසඳ හඳපානේ අපි යනවා
(v) නලපාන ජාතකය (ලකුණු 2 x 5 = 10)